සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## පළමු වාර පරීක්ෂණය 2018
# චිත්‍ර කලාව

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

### I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති රූප සටහන ඇසුරින් පිළිතුරු ලියන්න.



01 අනුරාධපුර යුගයට අයත් ................................................................................................ දාගැබ මෙහි දැක්වේ.

02 ක්‍රි.පූ. 01 ශතවර්ෂයේ දී ................................................................................................ රජු විසින් ඉදිකරන ලද්දකි.

03 මෙම ස්තූපය ................................................................................ හැඩයෙන් යුක්ත වූ බව වර්තමාන පිළිගැනීමයි.

04 මුල් අවධියේ ස්තූපයේ ................................................ වෙනුවට ඡත්‍රාවලියක් සහ ඒවා දරා සිටින යූපය නම් ශෛලමය ස්ථම්භයක් තිබී ඇත.

05 මෙම චෛත්‍ය පිවිසුම් දොරටුව සඳකඩ පහණ දෙපස ඇති ..................................... හා ..................................... බහිරව රූප දෙක ඉතා සුවිශේෂ වේ.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

06 ප්‍රකාශන චිත්‍රයක් යනු මානව රූප, ගස්වැල්, සතුන් ආදිය යොදා ගොඩනගනු ලබන සිතුවමකි. ( )

07 වර්ණවත් කඩදාසි ඉරා ඇලවීමෙන් ලබාගන්නා චිත්‍ර කොලාජ් චිත්‍ර නම් වේ. ( )

08 අනුරාධපුර ථූපාරාම චෛත්‍ය ධාන්‍යාකාර හැඩයෙන් යුක්ත ය. ( )

09 නත්තල් උත්සවය ඉස්ලාම් ප්‍රජාවට සුවිශේෂ වූ උත්සවයකි. ( )

10 ආරාධනා පත්‍ර, සුබ පැතුම් පත්‍ර සැකසීමේ දී සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය භාවිත කරයි. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(පෘතුගීසින් / දම් / නන්දි / මැටි / හර්මිකාව)

11 ශ්‍රී ලංකාවේ චෛත්‍යවල හතරැස් කොටුව යනුවෙන් හඳුන්වන අංගය ඉන්දියාවේ සාංචි ස්තූපයේ දී ....................................................... ලෙස හඳුන්වයි.

12 ශිව දෙවියන්ගේ වාහනය වන ............................................... ගවයාගේ රුව බොහෝ හින්දු දේවාල තුළ දැකගත හැකිය.

13 මූර්ති නිර්මාණය සඳහා පහසුවෙන් යොදාගත හැකි මාධ්‍යයක් ලෙස ............................................... භාවිතා කළ හැකිය.

14 ක්‍රිස්තියානි දේවස්ථාන ඉදිකිරීම සඳහා .................................................................................................. මුල්විය.

15 රතු සහ නිල් වර්ණය එකතුවීමෙන් ........................................................................................... වර්ණය සෑදේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 මුස්ලිම් පල්ලිවල සෑම කුළුණකම මුදුනෙහි දක්නට ලැබෙනුයේ,

(1) ඉර හා සඳ (2) අඩ සඳ හා තරුව
(3) ධර්ම චක්‍රය (4) කුරුසය

17 බුදුන් වහන්සේගේ තෙමඟුල සිහිගන්වමින් පවත්වනු ලබන උත්සවය නම්,

(1) නත්තල් උත්සවය (2) පොසොන් උත්සවය
(3) වෙසක් උත්සවය (4) තෛපොංගල් උත්සවය

18 කාටූන් නිර්මාණයකට උදාහරණයකි.

(1) හෝගානා පොකුණ (2) අධිරජ ධර්මාශෝක
(3) සුජාත දියණිය (4) පිස්සු පූසා

19 රුවන්වැලි සෑය වටා ඇති ඉතා විශිෂ්ට කලාත්මක නිර්මාණය,

(1) ඇත් පවුර (2) වටදාගෙය (3) වාහල්කඩ (4) ගල් කුළුණු

20 පැරණි චිත්‍ර ගුරුවරයා තම ගෝලයාට දුන් ප්‍රථම රේඛා අභ්‍යාසය,

(1) ලියපත (2) වකදෙක (3) පනාව (4) අරිම්බුව

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පහත සඳහන් මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.**

01 ඔබ කැමති ක්‍රීඩාවක සිත් ගත් අවස්ථාවක්

02 ජලාශයක් අසල ගැවසෙන වන සතුන්

03 වෙල්යායක සරුංගල් යවන ළමයි පිරිසක්

04 ඔබ කැමති මලක් සහ කොළයක් ඇසුරින් ව්‍යාප්ත මෝස්තරයක්

05 ඔබ ප්‍රියකරන කාටූන් අතර එන සත්ත්ව රූපයක් ඇසුරින් ළමා ඇඳුමකට මෝස්තරයක්

06 ඔබ සිත්ගත් කතන්දර පොතක් සඳහා සුදුසු මුල් පිටකවරයක් අඳින්න. (ලකුණු 60 යි.)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **පළමු වාර පරීක්ෂණය 2018**

**07 ශ්‍රේණිය** **චිත්‍ර කලාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | අභයගිරිය | 02 | වට්ටගාමිණී අභය / වළගම්බා | | 03 | ධාන්‍යාකාර | | 04 | කොත්කැරැල්ල |
| 05 | සංඛ නිධි හා පද්ම නිධි | 06 | ✓ | 07 ✓ | 08 | × | 09 × | 10 | ✓ |
| 11 | හර්මිකාව | 12 | නන්දි | 13 මැටි | 14 | පෘතුගීසින් | | 15 | දම් |
| 16 | අඩසඳ හා තරුව | 17 | වෙසක් උත්සවය | 18 | පිස්සු පූසා | 19 | ඇත් පවුර | | |
| 20 | වක දෙක | | | | | | | | (2 x 20 = 40) |

II කොටසට ලකුණු 60 යි.